**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ ප්‍රතිපත්තිමය ක්ෂය අනුපාතයෙන් බැහැරව ස්ථාවර වත්කම් ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.3,619,046 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අගය ශුන්‍ය වූ ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කර ඇති අතර, ක්ෂය ගණනයේ දී ඵලදායී ජීවන කාලය වෙනුවට පෙර ක්ෂය අනුපාත යොදා ගැනීම හේතුවෙන් සිදුවී ඇති දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරන අතර ඉදිරියේ දී ඵලදායී ජීවිත කාලය අනුව ක්ෂය ගණනය කරන බව. | අධිකාරියේ ප්‍රතිපත්තිමය ක්ෂය අනුපාතය අනුව ක්ෂය කළ යුතුය. |
| (ආ) | 2024 වර්ෂය තුළදී ස්ථාවර තැන්පත්වල කරන ලද ආයෝජනය රු.18,000,000 ක් සමාලෝචිත වර්ෂයේ ආයෝජන ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් ආයෝජන වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම ස්ථාවර තැන්පතුව සඳහා වූ චෙක්පත නිකුත්කර ඇත්තේ 2023 දෙසැම්බර් 29 දින හෙයින් එය එදිනට ගිණුම්ගත කර ඇති අතර අදාළ බැංකුව චෙක්පත නිෂ්කාශනය සිදුකර ඇත්තේ 2024 ජනවාරි 04 දින වන බැවින් එම නිෂ්කාශන දිනය සටහන් කර ඇත. කෙසේ වෙතත් මෙම නිෂ්කාශන කාලසීමාව මාර්ගස්ථ මුදල් ලෙස නැවත සටහන් කිරීමෙන් ආයෝජන ගිණුම නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | ගිණුම් වර්ෂය අවසන් දිනට පැවති ස්ථාවර තැන්පතු ශේෂ පමණක් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.86,261,778ක් වුවද, එය රු.78,064,586ක් වශයෙන් රු.8,197,192 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. තවද, පාරිතෝෂික අරමුදල් ආයෝජන ආදායම රු.9,735,679ක් වුවද, එය රු.14,496,105ක් වශයෙන් රු.4,760,426 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර තැන්පතු පොලි ආදායම 8,197,192 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කර අදාළ සංසන්දනාත්මක ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරන බව.<br>පාරිතෝෂිත අරමුදල් ආයෝජන ආදායම රු.4,760,426 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබ්මේ වරද නිවැරදි කර අදාළ ගැළපීම් සිදුකර සංසන්දනාත්මක ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සේවකයින්ගේ සේවා කාලය පූර්ණ වර්ෂයක් සම්පූර්ණ වී නොතිබියදී පූර්ණ වර්ෂයක් සඳහා පාරිතෝෂික ගණනය කිරීම සහ ඉකුත් වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදනය වැඩියෙන් දැක්වීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී ගැලපීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික ප්‍රතිපාදනය රු.8,930,758 ක් වැඩියෙන් ද, වර්ෂයට අදාල පාරිතෝෂික ඌණ වෙන් කිරිම් රු.1,784,559 ක් වැඩියෙන් ද , රඳවාගත් ඉපැයීම් රු.7,146,199ක් අඩුවෙන් ද දක්වා තිබුණි. | පාරිතෝෂිත ප්‍රතිපාදනය ගණනය කිරීමේ දී සේවකයින්ගේ සේවා කාලය ආසන්න මාසයට ගැළපීම හේතුවෙන් මෙම දෝෂය සිදු වී ඇත. එම නිවැරදි ගණනය කිරීම සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | සේවකයා සේවයේ යෙදී සිටි කාලය සඳහා පමණක් පාරිතෝෂිත ප්‍රතිපාදනය ගණනය කල යුතු අතර ඉකුත් වර්ෂයේ ගිණුම් දෝෂ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී ගැලපීම් කල යුතුය. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.52,338,000 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 91,246,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 38,908,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මුළු වියදම රු 137,090,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේදී ආරම්භ කර වර්ෂ කීපයකදී පනතේ වගන්ති 30ක් නීති කෙටුම්පත් | මේ වනවිට නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් විසින් පනත් කෙටුම්පත අධ්‍යයනය කර 2024.04.05 දින අමාත්‍යාංශ ලේකම් වෙත නිරීක්ෂණ යොමු කර තිබූ අතර, | පනත සංශෝධන කටයුතු කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්පාදක දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම හැර සමාලෝචිත වර්ෂය වන විට වසර 19 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි. | වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත ඉදිරි කටයුතු කිරීම සඳහා එකී නිරීක්ෂණ 2024.04.10 දිනැතිව යොමු කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඒ සම්බන්ධව ඉදිරි පියවර ගැනීම සඳහා යොමු කිරීමට නියමිත බව. | |
| (ආ) | අනාරක්ෂිත හා තත්ත්වයෙන් බාල නිෂ්පාදන මගින් පාරිභෝගිකයන් සුරක්ෂිත කිරීම සඳහා හඳුනාගත් නිෂ්පාදන කීපයක් සම්බන්ධයෙන් ආරක්ෂිත ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ස්විට්සර්ලන්තයේ එක් සමාගමක් සමඟ 2014 ජනවාරි මස 24 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සම්බන්ධයෙන් නිකුත් කර තිබූ විධාන අංක 49 නිශ්ප්‍රභා කරවා ගැනීම සඳහා භාණ්ඩ නිෂ්පාදන සමාගම් කීපයක් විසින් අධිකාරියට විරුද්ධව මහා අධිකරණයේ ගොනු කර තිබූ ඉල්ලුම්පත්‍රය සඳහා මහා අධිකරණය මගින් විධානය ක්‍රියාත්මක කිරීම වලක්වමින් අතුරු නියෝගයක් නිකුත් කිරීම හේතුවෙන් එම ස්විට්සර්ලන්ත සමාගම සමඟ එළඹි ගිවිසුමට අනුකූලව ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකිවී තිබුණි.<br><br>ගිවිසුම ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සමාගම විසින් ඒකපාර්ශවීයව ගිවිසුම අවලංගු කර ගිවිසුම් ප්‍රකාරව සම්පූර්ණ ආයෝජන මුදල වන රු.බිලියන 2.716 ක මුදලක් ගෙවන ලෙස ඉල්ලා අධිකාරියට එරෙහිව 2018 වර්ෂයේදී ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. බේරුම්කරණ නඩුව සඳහා අවසාන ප්‍රදානය 2022 මැයි 10 දින ලබා දී තිබුණු නියෝගය අනුව අධිකාරිය විසින් සමාගම වෙත රු. බිලියන 2.716 ක් ද, බේරුම්කරණ ගාස්තුව වශයෙන් ඇ.ඩො. 325,000 ක මුදලක් ද ගෙවියයුතු විය. බේරුම්කරණ නඩුවේ අවසාන ප්‍රදානයට එරෙහිව 2022 ජූලි 07 දින | මෙම බේරුම්කරණ නඩුවේ ප්‍රදානය 2022.05.10 වන දින ලබාදෙන ලද අතර, එකී ප්‍රදානයට අනුව රුපියල් බිලියන 2.176 ක් ගිවිසුම කඩ කිරීම මත අධිකාරියට ගෙවීමට නියම කර ඇත. එකී ප්‍රදානයට එරෙහිව නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත අධිකාරිය විසින් CHC 626/2023 නඩුකරය 2022 ජූලි 07 වන දින පවරා ඇත. ප්‍රදානය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා පෙත්සම්කාර සමාගම විසින් CHC 569/2023 නඩුකරය 2023 මැයි 16 වන දින කොළඹ වාණිජ මහාධිකරණයේ ගොනු කර ඇත. මේ වනවිට මෙම ගිවිසුම ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් යම් අක්‍රමිකතා සිදුව ඇත්දැයි සලකා බැලීමට අධිකාරිය විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ද, මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරන ලෙස ඉල්ලීමක් කර තිබුණි. එම ආයතනය විසින් එය ඔවුන්ගේ විෂය පථයට අදාළ නොවන බව දැනුම් දුන් අතර, ඔවුන් විසින්ම මෙම කටයුත්ත අල්ලස් හා දූෂණ විමර්ශන ඒකකය වෙත යොමු කර ඇති බව මේ වනවිට අප වෙත දන්වා ඇති බව. | ක්‍රියාත්මක කිරීමේ හැකියාව තහවුරු කර ගැනීමෙන් පසුව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතු අතර වගකිවයුතු පාර්ශවයන් කඩිනමින් හඳුනා ගත යුතුය. |

| | | | |
| --- | --- | --- | --- |
| | අධිකාරිය විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ පෙත්සමක් ගොනු කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් අධිකාරිය විසින් අභ්‍යන්තර විමර්ශණයක් පවත්වා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | | |
| (ඇ) | පාරිභෝගික ගැටළු ක්ෂණිකව ඉදිරිපත් කිරීම සහ පාරිභෝගිකයන්ට වෙළඳපොල මිල ගණන් දැන ගැනීම සඳහා 2015 වර්ෂයේදී 1977 දරන පාරිභෝගික විමසුම් සේවා (1977 Interactive Mobile Service) මෘදුකාංගය වෙනුවෙන් අධිකාරිය විසින් රු.5,401,428 ක් සහ මෙම ව්‍යාපෘතිය ජනතාව වෙත ප්‍රචාරණය කිරීම සඳහා රු.6,117,480 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, තාක්ෂණික ගැටලු පැනනැගීම සහ භාණ්ඩ මිලගණන් යාවත්කාලීන නොවීම වැනි දුර්වලතා හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද කාර්යයන් ඉටු වී නොතිබුණි. | මූලික අරමුණුවල දී සමහර අරමුණු ඉටුකර ගැනීම සඳහා අමාත්‍යාංශවල විෂය පථයන් අවස්ථා කිහිපයකදී වෙනස් වීමත්, ඒ අනුව එම ආයතන අතර සහ සම්බන්ධතාවය ගිලිහීයාමත් බාධාවක් විය. මේ වන විට 1977 කෙටි දුරකතන අංකයට ලැබෙන පැමිණිලි දිස්ත්‍රික්ක වෙත යොමු කර එහිදී ගනු ලබන පියවර කෙටි පණිවිඩයක් මඟින් පාරිභෝගිකයන් වෙත දැනුම්දීමට ද නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.<br>2024 මැයි 07 වන දින පැවති කෝප් කමිටුවේ දී එවකට වැඩබලන සභාපතිතුමිය විසින් එම දුර්වලතාවයන් අවම කර ගැනීම හා මෙමඟින් ඉටුකර ගත නොහැකි වන කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමට ආයතනයට නව MIS පද්ධතියක් හඳුන්වා දීමට අපේක්ෂා කරන බව දන්වන ලදි. | ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 සැප්තැම්බර් 14 දින පත් කරන ලද අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ සේවය 2020 පෙබරවාරි 14 දින සාධාරණ හේතු ඉදිරිපත් කිරීමෙන් තොරව අවසන් කිරීමට විරුද්ධව නිලධාරියා විසින් අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණු අතර එහි අවසාන ප්‍රදානය අනුව හිඟ වැටුප් සහ දීමනා ඇතුලත්ව රු.1,990,891ක මුදලක් අධිකාරිය විසින් නිලධාරියා වෙත ගෙවීමට සිදු වී තිබුණි. | නිලධාරියා සේවයෙන් ඉවත් කිරීමේ දී විධිමත් ක්‍රමවේදයකින් තොරව සිදුකිරීම හේතුවෙන් ඔහු විසින් අභියාචනාධිකරණයේ නඩුවක් ගොණුකර තිබූ අතර එහි අධිකරණ නියෝගය ප්‍රකාරව ඔහුට හිඟ වැටුප් ගෙවීමට තීන්දු කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් එම නිලධාරියා වෙත හිඟ වැටුප් ගෙවීමක් සිදුකර ඇති බව. | තීරණ ගැනීමේ දී විධිමත්ව හා කාර්යක්ෂමව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ වගන්ති අංක 27 අනුව අමාත්‍යවරයා විසින් තිරණය කරනු ලබන රුපියල් ලක්ෂයක් නොඉක්මවන වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත සෑම වෙළෙන්දෙකුම අධිකාරියෙහි | සෑම වෙළෙන්දෙකුම අධිකාරියෙහි ලියාපදිංචි කරගැනීම සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කරගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි මූලික පියවර මේ වනවිටත් සිදුකර ඇති අතර වෙළෙඳ අමාත්‍යාංශය මඟින් ඒ සඳහා මේ වනවිටත් කමිටුවක් පත්කර ඇත. | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලියාපදිංචි විය යුතු බවට දක්වා තිබුණ ද අධිකාරිය විසින් වෙළඳුන් ලියාපදිංචි කිරීම සිදු කර නොතිබුණි. | අධිකාරිය විසින් මේ වනවිට කෙටුම්පත් කර ඇති යෝජනා පත්‍රය එම කමිටුව මඟින් සළකා බලා අවශ්‍ය වැඩි දියුණු කිරීම් සිදුකිරීමට නියමිතය. තරඟකාරිත්ව ප්‍රවර්ධන අංශය මඟින් ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා ඇති ව්‍යාපාර ලියාපදිංචි කර ගනිමින් එහි නියමු ව්‍යාපෘතිය සිදුකර තිබෙන බව. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පනතේ වගන්ති අංක 17 ප්‍රකාරව වෙළෙන්දෙකු විසින් යම් භාණ්ඩයක් ඒ වෙළෙන්දාගේ සාමාන්‍ය වෙළඳ අවශ්‍යතාවයන් ඉක්මවන ප්‍රමාණයකින් ඔහුගේ වෙළඳ ව්‍යාපාරික ස්ථානයෙහි හෝ වෙනත් යම් ස්ථානයක හෝ සඟවා තබා ගැනීම නොකළ යුතු වුවද, වෙළඳපොල තුල කිරි සම්බා, බිත්තර, ගෑස්, කිරිපිටි, සීනි, බී ළූණු, පොහොර වැනි භාණ්ඩවල හිඟයන් වාර්තා වූ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත වගන්තිය යටතේ අධිකාරිය විසින් වැටලීම් සිදුකර නොතිබුණි. | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල 25 ක් පවතින අතර, එහි සමස්ත විමර්ශන නිලධාරීන් 450 සිටිය යුතු වුව ද, දැනට සක්‍රීය රාජකාරියේ යෙදී සිටින විමර්ශන නිලධාරීන් ගණන 282කි. වැටලීම් රාජකාරීවලට අමතරව එම නිලධාරීන්ට මිල සමීක්ෂණ, දැනුවත් කිරීම්, පාරිභෝගික පැමිණිලි විමර්ශන සහ අධිකරණ රාජකාරි කටයුතු සඳහා සහභාගී වීමට සිදුවේ. එවැනි තත්ත්වයක් තුළ පනතෙහි සියළුම වගන්ති ආවරණය කරමින් වැටලීම් කටයුතු සිදුකිරීම ප්‍රායෝගිකව දුෂ්කර වන අතර, එම දුර්වලතාවයන් හඳුනාගෙන 2024 වර්ෂයේ සිට වැටලීම් සිදුකිරීමේ දී වැටලීමේ වගන්ති ප්‍රකාරව රාජකාරි ඉලක්කයන් නියම කර ඇත. කෙසේ වුවත්, එක් එක් කාලසීමාවේ දී සිදුවන කාලීන පාරිභෝගික ගැටළු සඳහා ප්‍රමුඛතාවයන් ද ලබාදෙමින් අධිකාරිය පනතේ වගන්ති ප්‍රකාරව වැටලීම් ඉලක්ක සපුරාගත යුතු බවට උපදෙස් ලබාදී ඇති බව. | පනතේ වගන්ති ආවරණය වන පරිදි වැටලීම් සැලසුම් කල යුතුය. |
| (ආ) | දේශීය කිරි සම්බා සහල් සඳහා උපරිම සිල්ලර මිලක් පනවා තිබූ සමාලෝචිත වර්ෂයේ දී වෙළඳපොල තුල කිරි සම්බා සහල් සම්බන්ධයෙන් දැඩි හිඟයක් පැවතුණි. එසේ වුවද, කිරි සම්බා සහල් සම්බන්ධයෙන් වැටලීම් 596 ක් සිදුකර තිබුණු අතර එය අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද සමස්ත වැටලීම් සංඛ්‍යාව වූ 24,848 න් සියයට 2 ක් පමණක් විය. | පාරිභෝගික පැමිණිලි හා වෙළෙඳපොල වැටලීම් මඟින් කිරි සම්බා වැටලීම් 596ක් සිදුකර ඇත. මීට අමතරව කිරි සම්බා පිළිබඳ තොග ගබඩා පරීක්ෂාව ද දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලදි. මෙම සියළු කටයුතු සිදුකරනු ලබන්නේ අධිකාරියේ ප්‍රමාණවත් විමර්ශන නිලධාරීන් සංඛ්‍යාවක් නොපවතින පසුබිමක සීමාකාරී සාධක යටතේ ය. කෙසේ වුවද ඉදිරි විමර්ශන සැළසුම් ක්‍රියාත්මක කිරීමේ දී මෙම කරුණු පිළිබඳව ප්‍රමුඛත්වය ලබාදී වැටලීම් ඉලක්කගත සැලසුම සකස් කර ඇති බව. | කාලීන අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන වැටලීම් සැලසුම් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෙළඳපොල තුල වරින් වර මිල සංශෝධනයන්ට ලක් වූ සහ හිඟ තත්ත්වයන් වාර්තා වූ ගෘහස්ත ගෑස් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුල වැටලීම් 32ක් සිදු කර තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේ අධිකාරිය විසින් සිදුකරන ලද සමස්ත වැටලීම් සංඛ්‍යාව වූ 24,848න් සියයට 1 ක් පමණක් වී තිබුණි . | ආයතනික සීමාකාරී තත්ත්වයන් යටතේ වෙළෙඳපොළ තුළ ප්‍රායෝගිකව පවතින ගැටළු සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් කටයුතු කළ අතර, ඒම කාලවකවානුවේ දී ගෑස් සම්බන්ධව ලද පැමිණිලි සංඛ්‍යාව මත වැටලීම් සිදුකරන ලද බව. | කාලීන අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන වැටලීම් සැලසුම් කල යුතුය. |
| (ඇ) | පනතේ 12 වන වගන්තිය යටතේ නියමකර ඇති ප්‍රමිති හා පිරිවිතරවලට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කිරීමට අධිකාරියට ලැබෙන පැමිණිලි හා කාලීනව ගැටලුකාරී අවස්ථාවන්වලදී සාම්පල පරීක්ෂාවන් සිදුකළ යුතු වේ. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රමිති අනිවාර්ය කර තිබූ භාණ්ඩ වර්ග 34 න් තෝරා ගත් භාණ්ඩ වර්ග ඇතුළත් භාණ්ඩ වර්ග 29 ක් සම්බන්ධයෙන් සාම්පල 133 ක් පමණක් පරීක්ෂා කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් භාණ්ඩ හා සේවාවන්හි ප්‍රමිතිය සම්බන්ධයෙන් අදාල පරීක්ෂණ ප්‍රමාණවත් පරිදි සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව නියැදි පරීක්ෂාවේ දී වැඩි අවධානයක් යොමු කරන ලද්දේ වෙළෙඳපොලේ ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දෙන ලද පාරිභෝගික භාණ්ඩ සඳහා වේ. ඒ අනුව ක්‍රියාකාරී සැළැස්මේ ඉලක්කගත නියැදි පරීක්ෂාව සපුරාගෙන ඇති අතර, එහි දී යම් සීමාවීමක් සිදුව ඇත්තේ අයවැය ප්‍රතිපාදන සීමාවන් යටතේ බාහිර රසායනාගාරවලින් මෙම පරීක්ෂාවන් සිදුකිරීම හේතුවෙනි. | භාණ්ඩ හා සේවාවන්හි ප්‍රමිතිය සම්බන්ධයෙන් අදාල පරීක්ෂණ ප්‍රමාණවත් පරිදි සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | බිත්තර සම්බන්ධයෙන් විශාල හිඟයක් පැවති සහ පාලන මිලක් පනවා තිබුණු 2023 ජනවාරි සිට මැයි දක්වා මාස 05 ක කාලපරිච්ඡේදය තුළ බිත්තර සම්බන්ධයෙන් රට තුළ සිදුකර තිබූ සමස්ත වැටලීම් සංඛ්‍යාව 1179 ක් වූ අතර, ඒ අනුව එක් මාසයක් තුල සිදුකර තිබූ වැටලීම් සංඛ්‍යාවෙහි සාමාන්‍යය 236 ක් වී තිබුණි. කෙසේ වුවද, විමර්ශන නිලධාරීන් 277 ක් සේවයෙහි යොදවා තිබීම හේතුවෙන් එක් විමර්ශන නිලධාරියෙකු විසින් මාසයක් තුල සිදු කරන ලද බිත්තර වැටලීම් සංඛ්‍යාවෙහි සාමාන්‍ය 01 කටත් අඩු වී තිබුණි. | ආයතනික සීමාකාරී තත්ත්වයන් යටතේ වෙළෙඳපොල තුළ එක් එක් කාලවකවානුවේ උද්ගතවන ප්‍රායෝගික ගැටළු සඳහා ප්‍රමුඛතාවය ලබාදීම මෙන්ම ආයතනික අරමුණු ළඟාකර ගැනීමේ දී සිදුකළ යුතු රාජකාරීන් හා සාමගාමීව ලැබෙන බිත්තර මිල පිළිබඳ පැමිණිලි මත හා වෙළෙඳපල තුළ බිත්තර හිඟය පිළිබඳ නිරීක්ෂණයේ දී සිදුකරන හඳුනාගැනීම් මත මෙම වැටලීම් සංඛ්‍යාව සිදුකරන ලදි. | කාලීන අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ප්‍රමාණවත් වැටලීම් සංඛ්‍යාවක් සිදු කල හැකි පරිදි වැටලීම් සැලසුම් කල යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුල මධ්‍යම කළමනාකරණ මට්ටමේ සහකාර අධ්‍යක්ෂ තනතුරු 15 ක් , කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 08 ක්, මෙහෙයුම් මට්ටමේ විමර්ශන නිලධාරි තනතුරු 104 ක් සහ පිරිවැය/ගිණුම් නිලධාරී තනතුරු 12ක් පුරප්පාඩු වී තිබුණි. | අධිකාරියේ පැවති පුරප්පාඩු තනතුරු සඳහා සුදුසු අය වහාම බඳවා ගැනීමෙන් එම අරමුණු කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අධිකාරිය විසින් මේ වනවිටත් උපරිම පරිශ්‍රමයෙන් කටයුතු කර ඇති බව හා ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ අනුමැතීන් ලද පසුව එම පුරප්පාඩු තනතුරු සඳහා කඩිනමින් බඳවාගැනීමට අවශ්‍ය කටයුතු අධිකාරිය විසින් කටයුතු සිදුකිරීමට නියමිත බව. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර පනතේ ප්‍රධාන අරමුණු කර්යක්ෂමව ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |